## 2025 අගෝස්තු මාසයට අදාලව 2025.08.19 වන දින පවත්වන ලද
## බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2025.08.19
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය** -

| | | |
|---|---|---|
| 01. වී.සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ආර්.බී. අත්තනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. පී.ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 10. ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 15. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 16. ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 17. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

## 01.පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2025.07.22 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2025.08.11 වන දින යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සහා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් සභාවට දන්වන ලදි.

ගරු උප උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා 2025.07.22 දින පවත්වන ලද මාසික මහ සභා වාර්තාන සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පසුගිය මස සභා වාර්තාවේ 25 වන පිටුවේ සඳහන් ගරු මන්ත්‍රී පී.කේ.ඩී.පුෂ්ප කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනා අංක 05.04.01 මඟින් ඉදිරිපත් කර තිබූ තරුමල්විල මාවත අමරපාල පුංචිහේවා මාවත ලෙස වෙනස් කිරීමේ යෝජනාවේදී ඩබ්.එම්. රූපසේන යන තමා විසින් පවසන ලද

**"මෙම මාර්ගය සම්බන්ධ ඉඩම කට්ටි කිරීමේදී ඉඩමේ අයිතිකරු විසින් සුදත් පුංචිහේවා මහතාගෙන් පර්චසය රු.9000.00 බැගින් පර්චස් 10ක් සඳහා රු.90,000.00ක් ගෙවා මිලදී ගෙන මෙම පාර ලබා ගෙන ඇති බව "** සංශෝධනය වියයුතු අතර එම සංශෝධනයට යටත්ව 2025 ජුලි මස 22 වන දින පැවැත්වූ සභාවේ වාර්තාව සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

ගරු මූලාසනය විසින් එම සංශෝධනය පිළිගැනීමට එකඟ වන්නේ දැයි විමසා සිටි අතර විරුද්ධත්වයක් නොමැති නම් සභා සම්මත කර ගන්නා ලෙස පැවසීය.

එම සංශෝධනය ගරු මන්ත්‍රී ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම සංශෝධනය සහිත වාර්තාවට විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුයෙන් 2025.07.22 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

## 02. මූලාසනය විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

### 02.01. 2025 වර්ෂය සඳහා පළාත් පාලන සතිය ක්‍රියාත්මක කිරීම

රාජ්‍ය පරිපාලන හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ PL/7/3/ ප.පා.සතිය -2025 හා 2025.08.05 දිනැති ලිපිය මගින් හා පළාත් පාලන කොමසාරිස්ගේ 12/4/2/ප.පා. සතිය හා 2025.08.13 දිනැති ලිපියට අනුව 2025 වර්ෂයේ පළාත් පාලන සතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව උපදෙස් ලබා දී ඇත. ඒ අනුව 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 15 දින සිට 21 දින දක්වා

- ජංගම සේවා දිනය - 2025.09.15
- පරිසර හා රුක්රෝපණ දිනය - 2025.09.16
- සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය - 2025.09.17
- ආදායම් ප්‍රවර්ධන දිනය - 2025.09.18
- සාහිත්‍ය හා අධ්‍යාපන පුස්තකාල ප්‍රවර්ධන දිනය - 2025.09.19
- මහජන උපයෝගීතා දිනය හා ක්‍රීඩා දිනය - 2025.09.20
- සහතික පත්‍ර ප්‍රදානය සහ සමාප්තිය - 2025.09.21

වශයෙන් එම සතිය තුළ බිබිල ප්‍රාදේශීය සභාව මගින් වැඩසටහන් ක්‍රියාත්මක කරන බැවින් එම වැඩසටහන් සඳහා මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාම සහභාගිව එම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබා දෙන ලෙස දන්වා සිටිමි.

### 02.02.Clean Sri Lanka වැඩසටහනට සමගාමීව ඌව පළාත් සභාවේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

පළාත් පාලන කොමසාරිස්ගේ 12/03/10/Clean Sri Lanka හා 2025.08.18 දිනැති ලිපිය මඟින් දන්වා ඇති පරිදි පළාත් පාලන බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේ Clean Sri Lanka වැඩසටහනට සමගාමීව පළාත් පාලන විෂය පථය තුළ සමාජීය, පාරිසරික හා සදාචාරාත්මක අරමුණු සාක්සාත් කරගත හැකි වන පරිදි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති යෝජනා මෙහි පහත සඳහන් ආකෘතියට අනුව සකස් කර 2025.08.22 දිනට පෙර යැවීමට අවශ්‍ය බැවින් මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාගේ යෝජනා 2025.08.22 දිනට පෙර ලබා දෙන මෙන් කාරුණිකව දන්වා සිටිමි. ( සැ.යු. - මාර්ග, ජල, සංචාරක, වීථි පහන් ,ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රීඩා හා නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධනය පිළිබඳව වැඩි අවධානයක් යොමුකළ හැකිය.)

| අ/අ | ව්‍යාපෘති යෝජනාව | ක්‍රියාකාරකම් | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු | Clean Sri Lanka වැඩ සටහන යටතේ අයත් වන අරමුණු බාණ්ඩය ( සමාජීය/ පාරිසරික /සදාචාරාත්මක) | ක්‍රියාත්මක කිරීමට යෝජිත ස්ථානය/ ස්ථාන | ආවරණය වන ප්‍රතිලාභීන් හා සංඛ්‍යාව | දළ ඇස්තමේන්තු මුදල (රු.) | ඡයා රූප |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

## 03.<u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා</u> <u>සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u>

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## <u>04.යථාපරිදි කල්දි ඇති ප්‍රශ්න.</u>

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 05.යථාපරිදි කල්දි ඇති යෝජනා.

## 05.01.<u>ගරු මූලාසනයේ යෝජනා.</u>

## <u>05.01.01. විගණන මතය හා සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන වාර්තාව සඳහා තත්වාගණනය කරන ලද මතයක් විගණනය විසින් ප්‍රකාශ කර ඇත. ඒ අනුව 2024 වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි ඓතිහාසික පිරිවැය මත ගිණුම්ගත කර ඇති බවත් 2025 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමටත් , බිබිල සභාවට අයත් සුසානභූමි 46 තක්සේරු කර ගිණුම්ගත නොකර ඇති බවත් පෙන්වා දී ඇත. එම අඩුපාඩු නිවැරදි කර ගැනීම පිළිබඳ සාකච්ඡා කර සුදුසු තීරණයක් ගැනිමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවේ 2024 වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි ඓතිහාසික පිරිවැය මත ගිණුම් ගත කර ඇති නිසා 2025 වර්ෂයේ දී ප්‍රත්‍යගණනය කර ගිණුම්ගත කිරීමට වාර්ෂික විගණනය මගින් පෙන්වා දී ඇත. එම ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් කාර්මික නිළධාරි ඇතුළත්ව කමිටුවක් පත්කර එම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර එම වටිනාකම මත ගිණුම්ගත කිරීම සඳහා විගණන නිළධාරීන් විසින් වාචිකව උපදෙස් ලබාදී ඇතත් ලිඛිතව සටහනක්

නොමැති බැවින් මේ පිළිබඳව පළාත් පාලන කොමසාරිස් ගෙන් උපදෙස් ලබා ගෙන නැවත මහ සභාවට ඉදිරිපත් කරන ලෙස තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.02. ගම් පිඹුරු අංක 573 හි අතිරේක අංක 03 දරන සැලැස්මෙහි කැබලි අංක 533 දරන ඉඩම් කොටස බෝධිරුක්ඛාරාම විහාරස්ථානය වෙත බැහැර කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ එකඟතාවය ලබාදීම සම්බන්ධවයි.

බිබිල ශ්‍රී බොධිරුක්ඛාරාම විහාරස්ථානයේ විහාරාධිපති දොඩම්ගොල්ලේ සෝරත හිමියන් විසින් ඉඩම් අනු කොටස් අනුමත කර ගැනීමේ අයදුම්පතක් ප්‍රාදේශිය සභාව වෙත ඉදිරිපත් කර ඇත.

එච්.එම්.සිරිසේන උණවටුන මහතා විසින් මැන සකස් කරන ලද අංක 1887 මානක සැලැස්ම සංවර්ධන කටයුතු සඳහා අනුමත කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කරන ලදී. ඒ අනුව නාගරික සංවර්ධන අධ්‍යක්ෂ විසින් දොඩම්ගොල්ලේ සෝරත හිමි විසින් අනුමැතියට ඉදිරිපත් කොට ඇති අවසන් ගම් පිඹුරු අංක 573 හි අතිරේක අංක 03 දරන සැලැස්මෙහි කැබලි අංක 533 දරන ඉඩම් කොටස ඉඩම් අත්කර ගැනීමේ පනතේ ප්‍රතිපාදන මත නාගරික සංවර්ධන අධිකාරිය අත්පත් කරගෙන ඇති බැවින් , එකී ඉඩම් කොටස බෝධිරුක්ඛාරාම විහාරස්ථානය වෙත බැහැර කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ එකඟතාවය විමසා ඇත. ඒ පිළිබඳව සාකච්ඡා කොට සුදුසු තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගම් පිඹුරු අංක 573 හි අතිරේක අංක 03 දරන සැලැස්මෙහි කැබැලි අංක 533 දරන ඉඩම් කොටස දැනට නඩු තීන්දුවකින් බොධිරුක්ඛාරාම විහාරස්ථානයට භුක්තිය සඳහා ලබා දී ඇත. මෙම ඉඩම් කොටසෙහි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය ගොඩනැගිලි සැලැස්ම සඳහා අවසර ලබා ගැනීමට බිබිල ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ බැවින් එම ඉඩමෙහි අයිතිය පිළිබඳව තහවුරුවක් නොමැති බැවින් එම ඉඩමේ අයිතිය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමට බිබිල ප්‍රාදේශීය සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරියට දන්වා යවා ඇත. මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් බැවින් එම ඉඩමෙහි අයිතිය බිබිල ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරස්ථානයට පැවරීමට බිබිල ප්‍රාදේශීය සභාවේ එකඟතාවය විමසා ඇත. මෙම ඉඩම පිහිටා ඇත්තේ ආදායම් උත්පාදනය කළ හැකි ස්ථානයක බැවිනුත් සභාවට සතුවීමට ඇති ඉඩමක් බැවිනුත් මහජන දේපල සුරැකීම සඳහාත් විහාරස්ථානයට හා ස්වාමීන් වහන්සේට හා බිබිල ප්‍රාදේශීය සභාවට යන දෙපාර්ශවයටම ආදයම් ලබා ගැනීම සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත අවුරුදු 30 ක කාලසීමාවක් සඳහා විහාරස්ථානයට බදු දීමට හා විහාරාධිපති ස්වාමීන් වහන්සේ ගොඩනැගිලි ඉදිකිරීමේදී ඒ පිළිබඳව ප්‍රාදේශීය සභාවේ කාර්මික නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමට සුදුසු බව අදාල යෝජනාව සම්බන්ධයෙන් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත

අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

එම සාකච්ඡාවෙන් පසු මෙම ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශිය සභාවට පවරාගෙන දීර්ඝකාලීන බදු පදනම මත අවුරුදු 30කට බිබිල ශ්‍රී බොධිරුක්ඛරාම විහාරස්ථානයට බදුදීම සම්බන්ධයෙන් අදහස් දක්වන ලෙස ගරු සභාවට මූලාසනය විසින් දන්වා සිටින ලදී.

**<u>ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා අදහස් දැක්වීම.</u>**

දැනට මෙම ඉඩම බිබිල ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරය විසින් භුක්ති විඳින බැවින් එම ඉඩම විහාරස්ථානය සඳහාම ලබාදීමට සුදුසු බව පවසා සිටින ලදී.

**<u>ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා අදහස් දැක්වීම.</u>**

මෙම ඉඩම පැවරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් උපදෙස් පැතීම සුදුසු බව පවසා සිටි අතර මෙම ඉඩම විහාරස්ථානයට පවරාදීමට තමා පෞද්ගලිකව අකමැත්තක් නොමැති වුවද ප්‍රාදේශීය සභාව සතුව ද දේපල විශාල ප්‍රමාණයක් නොමැති බැවින් ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන දීර්ඝකාලීන බදු පදනම මත අවුරුදු 30කට බිබිල ශ්‍රී බොධිරුක්ඛරාම විහාරස්ථානයට බදු ලබාදීමට කැමති බව ප්‍රකාශ කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දැක්වීම.</u>**

බිබිල බොධිරුක්ඛාරාම විහාරස්ථානයේ දායකයකු වූ තමන්ට පන්සලට විරුද්ධව කටයුතු කළ නොහැකි බවත් මෙම ඉඩම ඉතා දීර්ඝ කාලයක් තිස්සේ සිටම විහාරස්ථානය විසින් භුක්ති විඳින බවත් පන්සලේ අපවත් වී වදාළ භික්ෂූන් වහන්සේලා සියළු දෙනාගේ භෂ්මාවශේෂ තැම්පත් කර ඇත්තේ මෙම ඉඩමෙහි බවත් පැවසීය. මෙම විහාරස්ථානයේ ඉදිකර ඇති නව ගොඩනැගිල්ලෙහි කොටසක් මෙම ඉඩමෙහි පිහිටා ඇති බවත් ඒ සඳහා බිබිල ප්‍රාදේශීය සභාව විරුද්ධ වී නොමැති බවත් මෑතකදී අපවත් වී වදාළ විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ භෂ්මාවශේෂ මෙම ඉඩමෙහි තැම්පත් කිරීමට ද ප්‍රාදේශීය සභාව විරුද්ධ වී නොමැති බවත් පෙන්වා දෙන ලදී. මෙතෙක් කාලයක් විහාරස්ථානය විසින් භුක්ති විදි මෙම ඉඩම් කොටස විහාරස්ථානයට පවරා දීමට කැමති බව පවසා සිටින ලදී.

**<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා අදහස් දැක්වීම.</u>**

මෙම ඉඩම දීර්ඝ කාලීන බදු පදනම මත විහාරස්ථානයට බදු ලබාදීමට ක්ෂණික තීරණයක් ගැනීමට නොහැකි බවත් විහාරාධිපති ස්වාමීන් වහන්සේ සමඟ සාකච්ඡා කොට තීරණයක් ගැනීමට මෙම යෝජනාව ඉදිරි සභාවාරයට කල් තැබීමට සුදුසු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය.</u>**

මෙම ඉඩම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් වගකීම පැහැර හැර ප්‍රාදේශීය සභාව සඳහා වගකීම පවරා ඇති බවක් පෙනී යන බැවින් බෞද්ධයන් ලෙස මේ සඳහා තීරණ ගැනීමට තවත් කාලයක් අවශ්‍ය බැවින් ඉදිරි සභාවාරයට කල් දැමීම සුදුසු බව පවසන ලදී.

ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා.

දහම හා සංස්කෘතියට අපි සියළුදෙනා බැඳී සිටියද මහජනතාවගේ ජන වරමින් පත්වී සිටින මහජන නියෝජිතයින් වන බැවින් සභාව සතුවීමට පවතින ඉඩමක් වන මෙම ඉඩම විහාරස්ථානයට අයිතිය ලබාදීමට තමන් අකමැති බවත් විහාරස්ථානයට හා ප්‍රාදේශීය සභාවට යන දෙපාර්ශවයටම සාධාරණයක් වන ලෙස ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන දීර්ඝ කාලීන බදු පදනම මත අවුරුදු 30කට විහාරස්ථානය බදු ලබාදීමට කැමති බව පවසා සිටින ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා.

අනාගතයේදී බිබිල නගරය ප්‍රධාන නගරයක් වන බැවින් මහ ජනතාවගේ වාසයට ඉතාමත් සුදුසු දේශගුණික තත්වයකින් යුතු සශ්‍රීක නගරයක් වන බැවින් නගරය දියුණු කිරීම සඳහා ඉඩම් අවශ්‍ය වන බැවින් ආගමට නම්‍යශීලී නොවී විහාරස්ථානයේ භුක්තියට හා ඉඩමේ පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන දීර්ඝකාලීන බදු පදනම මත අවුරුදු 30කට බදු ලබාදීමට සුදුසු බව පවසන ලදී.

ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා.

මෙම ඉඩම විහාරස්ථානයට භුක්තිය ලබාදී පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන විහාරස්ථානයට දීර්ළ කාලීන බදු පදනම මත අවුරුදු 30කට බදු ලබාදීමට සුදුසු බව පවසන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා.

මේ සියළු දෙනාම පන්සල හා බැඳී සිටින දායකයින් වුවත් අනාගත පරපුර සඳහා නගරය දියුණු කිරීම සඳහා ප්‍රාදේශිය සභාවට ඉඩම් අවශ්‍ය බැවින් මෙම බොධිරුක්බාරාම විහාරස්ථානය විසින් භුක්ති විදිනු ලබන ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාව සතුව තබා ගතයුතු බවත් ,මහජන නියෝජිතයින් පොදු දේපල සුරැකීම සඳහා ප්‍රාදේශීය සභාවට පත්කර ඇති බැවින් ජනතා නියෝජිතයින් ලෙස දේපල සුරැකිමට හා ඉදිරි පරපුර සඳහා ආරක්ෂා කිරීම සඳහා ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන දීර්ඝ කාලීන බදු පදනම මත අවුරුදු 30කට විහාරස්ථානයට බදු ලබාදීමට සුදුසු බව පවසන ලදී.

ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා.

මෙම ඉඩම දැනට බෝධිරුක්බරාම විහාරස්ථානය භුක්ති වින්දද නාගරික සංවර්ධන අධිකාරිය විසින් විහාරස්ථානයට පැවරීම සඳහා එකඟතාවය විමසනු ලබන්නේ ප්‍රාදේශීය සභාව සඳහා යම් අයිතියක් ඇති නිසා වන්නට ඇතැයි ද මෙම ඉඩම විහාරස්ථානයට හා ප්‍රාදේශීය සභාව යන දෙපාර්ශවයටම කොටස් දෙකක් වශයෙන් බෙදාගෙන අයිතිය ලබා ගැනීම සුදුසු බව බවසා සිටියේය. ගරු මූලාසනය විසින් එසේ බෙදා ගැනීමට ප්‍රමාණවත් නොවන බව පැවසූ පසු සහජීවනය පදනම් කරගෙන ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන දිගු කාලීන බදු පදනම මත අවුරුදු 30කට විහාරස්ථානයට බදු දීමට තමාද එකඟ බව පවසා සිටින ලදී.

ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා.

බිබිල ශ්‍රී බෝධිරුක්බාරාම විහාරයට මෙම ඉඩම් කොටසෙහි අයිතිය ඉල්ලුවද එහි නෛතික පදනමක් නොමැති නිසා මෙම ඉඩමෙහි අයිතිය ලබා දීමට නොහැකි වී ඇත. මෙම ඉඩම සම්බන්ධයෙන් නඩු මහකට ගියහොත් නඩුව දීර්ඝ කාලයක් දිගුවනු ඇති බැවින් මෙම නගරය දියුණු නගරයක් බවට පත්වුවද කිසිම ප්‍රයෝජනයට නොගන්නා බිම් කැබැල්ලක් නගරය මධ්‍යයේ තිබීම සුදුසු නැති බවත් එම නිසා විහාරස්ථානයට හා බිබිල ප්‍රාදේශීය සභාවට යන දෙපාර්ශවයටම ආදායම් උත්පාදනය කර

ගතහැකි සාධාරණ තීරණයක් ලෙස ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන දිගු කාලීන බදු පදනම මත අවුරුදු 30කට විහාරස්ථානයට බදු දීමට තමාද එකඟ බව පවසා සිටින ලදී.

**<u>ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා.</u>**

සෑම නගරයකටම පිවිසෙන විට නගරවාසීන් කවුදැයි අවබෝධ කරගැනීම සඳහා විශාල බුදු පිළිම , පල්ලි ආදිය ඉදිකර තිබේ. නමුත් බිබිල නගරයේ එවැනි ඉදිකිරීම් නොමැති නිසා මෙම ඉඩමෙහි එවැනි ආගමික වශයෙන් වැදගත් ඉදිකිරීමක් සිදුකළ හැකි බව පැවසීය. මෙම ඉඩමෙහි අපවත් වී වදාළ ස්වාමීන් වහන්සේලාගේ භෂ්මාවශේෂ තැම්පත් කිරීමේදී හා දූම් පරීක්ෂාව සිදුකිරීමේදී මෙතෙක් බිබිල ප්‍රාදේශිය සභාව විරෝධතාවයක් ඉදිරිපත් කර නොමැත. විහාරාධිපති ස්වාමීන් වහන්සේ සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ඉදිරි මහ සභාවකට ඉදිරිපත් කර තීරණ ගැනීම සුදුසු බව පවසන ලදී. ඉදිරියේ දී විහාරාධිපති ස්වාමීන් වහන්සේ එම ස්ථානයේ ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකරන බව ගරු සභාපතිතුමා විසින් දැනුවත් කළ පසු එම ගොඩනැගිල්ලෙහි ඉහළ මාලයෙහි බුදුන් වහන්සේගේ පිළිරුවක් තැම්පත් කිරීම සුදුසු බව ද පවසාලීය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා.</u>**

මහජන නියෝජිතයින් ලෙස මහජනතාව තමන්ව පත් කර ඇත්තේ මහජන දේපල සුරැකීම සඳහා , ඒ අය සඳහා සුවපහසු නගරයක් බිහිකර දීම සඳහා බවත් මෙවැනි යෝජනා සඳහා තීරණ ගැනීමේදී අනාගතය පිළිබඳ සලකා බලා එම අනාගත පරපුරට අසාධාරණයක් නොවන ආකාරයෙන් තීරණ ගතයුතු බවත් විහාරාධිපති ස්වාමීන් වහන්සේට හා බිබිල ප්‍රාදේශීය සභාව යන දෙපාර්ශවයටම සාධාරණයක් වන ආකාරයට මෙම ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන දීර්ඝ කාලීන බදු ගිවිසුමකට එළඹ අවුරුදු 30කට විහාරස්ථානයට බදු ලබාදීමට සුදුසු බවත් බිබිල නගරයේ ප්‍රාදේශීය සභාව සතු ඉඩම් මේ වනවිට විශාල ප්‍රමාණයක් මහ ජනතාව විසින් අත්පත් කරගෙන ඇති බවත් එම නිසා සභාව සතු දේපල ආරක්ෂා කරගෙන සංවර්ධනයක් සිදු කිරීමට තමා කටයුතු කරන බවත් පවසාලීය.

**<u>ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය.</u>**

බෝධිරුක්ඛාරාම විහාරාධිපති ස්වාමීන් වහන්සේ සමඟ පෞද්ගලික ගැටලුවක් නොමැති බවත් අනාගතය වෙනුවෙන් අනාගත පරපුර වෙනුවෙන් බිබිල නගරයේ මෙම ඉඩම සුරක්ෂිත කර ගතයුතු බවත් මෙම ඉඩම විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් නගරයේ වෙළඳ ප්‍රජාවේ කිහිප දෙනෙකු සමඟ එක්ව ව්‍යාපාරික ස්ථාන ගොඩනැගීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වන බැවින් මෙම ඉඩම් කොටස පිළිබඳ තීරණ ගැනීමේදී , තමන් කෙරෙහි විශ්වාසය තබා සභාවේ දේපල සුරැකීමට පත් කළ බැවින් එය සුරකින ආකාරයෙන් කටයුතු කළ යුතු බව පැවසීය. යශෝදරා බාලිකා විද්‍යාලයේ සේවය කර විශ්‍රාම ගිය විදුහල්පතිනිය වන තමා අනවසර ඉදිකිරීමක් සම්බන්ධයෙන් විරුද්ධව අධිකරණයට ගොස් තමන් විත්තිකරුවෙකු ලෙස අධිකරණයට පෙනී සිටින බවත් එබැවින් මෙවැනි අනවසර ඉදිකිරීම් සිදු කිරීමට යන මෙම ඉඩම සම්බන්ධයෙන් අනාගතය ගැන සලකා බලා බුද්ධියෙන් තීරණ ගතයුතු බවත් එම නිසා තමා ද මෙම ඉඩම ප්‍රාදේශීය සභාව සඳහා පරම අයිතිය ලබාගෙන දීර්ඝකාලීන බදු පදනම මත අවුරුදු 30කට විහාරස්ථානයට බදු ලබාදී ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගැනීමට සුදුසු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී පී. ජයන්ති මැතිතුමිය.</u>**

අප සියළු දෙනා බුදු දහම අදහන බෞද්ධයන් වුවත් මෙම ඉඩම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේදී මහ ජනතාවගේ පාර්ශවයෙන් බලා තීරණයක් ගතයුතු බවත් ආගමානුකූලව තීරණයක් ගැනීමට සුදුසු නොවන බවත් පැවසීය. මහජන නියෝජිතයින් ලෙස පත්වී ඇති තමන්ගේ වගකීම මහජනයා

වෙනුවෙන් යමක් කිරීම බැවින් මෙම ඉඩම ප්‍රාදේශීය සභාව සඳහා පරම අයිතිය ලබාගෙන දිර්ඝකාලීන බදු පදනම මත විහාරස්ථානයට  අවුරුදු 30කට බදු ලබාදීම සුදුසු බවයි.

**<u>ගරු මන්ත්‍රී එල්.ඒ.බී. චින්තිකා හර්ශනී මැතිතුමිය.</u>**

තමාත් බෞද්ධාගමිකයෙක් බවත් එය උප්පැන්න සහතිකයට සීමා නොවන්නක් බවත් විහාරස්ථානය සමඟ එකට බැඳි සමාජයක ජීවත්වන බැවිනුත් විවිධ පුද්ගලයින් විවිධ අවශ්‍යතා ඉටුකර ගන්නා ආකාරය විවිධ බැවිනුත් තමාට පෞද්ගලික තීරණයක් ගැනීමට නොහැකි බැවින් විහාරස්ථානය සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීමට ඉදිරි සභාවාරයට කල්දැමීම සුදුසු බව පැවසීය.

එම අවස්ථාවේදී බෙදීමක් අවශ්‍ය බවත් ඡන්ද විමසීමකට යායුතු බවත් ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙම ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන දීර්ඝකාලීන බදු පදනම මත අවුරුදු 30කට බිබිල ශ්‍රී බොධිරුක්ඛාරාම විහාරස්ථානයට බදු දීමට

- පක්ෂව ඡන්ද - 10
- විරුද්ධව ඡන්ද - 02
- ඡන්දය දීමෙන් වැලකී සිටි - 04
- සභා ගර්භයේ නොසිටි - 01
- එදින සභාවට නොපැමිණි - 01

ඒ අනුව මෙම ඉඩමෙහි පරම අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන දීර්ඝකාලීන බදු පදනම මත අවුරුදු 30කට බිබිල ශ්‍රී බොධිරුක්ඛාරාම විහාරස්ථානයට බදු දීමට වැඩි ඡන්දයෙන් යෝජනාව සභා සම්මත විය.

## <u>05.01.03 ගම්මානයට පිවිසෙන මාර්ගය සඳහා නමක් යෝජනා කිරීම.</u>

බිබිල, බදුල්ල පාර,රජයේ ගොවිපොළ ඉදිරිපිට පිහිටා ඇති ගම්මානයේ නාමල් පෙදෙස සුභ සාධන සංගමය ලිපියක් ඉදිරිපත් කරමින් දැනට එම ප්‍රදේශයට **රජයේ ගොවිපොළ ඉදිරිපිට ගම්මානය** ලෙස නම් කර ඇති බවත් එසේ නම්කර තිබීම මෙම ප්‍රදේශයේ පුද්ගලයින්ට ලිපි ලැබීමේදී පවා ගැටලු මතු වී ඇති බවත්ය. එම නිසා මෙම ගම්මානයට ඇතුළුවන  මාර්ගය **නාමල් පෙදෙස මාවත** ලෙස නම් කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. එම ඉල්ලීම පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගැනීම  සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගය ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් බවත් එම යෝජනාව සම්බන්ධයෙන් සවිස්තර පැහැදිලි කිරීමක්  කළ මූලාසනය විසින් අදාළ යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ  යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.04. අබලන් වී ඇති  මහියංගන පාරේ 06 කනුව සිට විනියමුල්ල එගොඩවෙල මාර්ගය හා හෙනගහවෙල පත්තාගහරාව දක්වා ඇති හෙනගහවෙල වෙල  මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධවයි.

කෙහෙල්අත්තාවෙල ගොවි සංවිධානය මඟින් ඉදි කරගෙන  ඇති කෙහෙල්අත්තාවෙල ග්‍රාම නිළධාරි වසමට අයත් මහියංගන පාරේ 06 කනුව සිට විනියමුල්ල එගොඩවෙල මාර්ගය ගොවින්ගේ කෘෂි ද්‍රව්‍ය ප්‍රවාහනය කරන මාර්ගයකි. එම මාර්ගය හා හෙනගහවෙල පත්තාගහරාව දක්වා ඇති හෙනගහවෙල වෙල  මාර්ගය දැනට වාහනයක් ගැනීමට නොහැකි තරම් වලවල් සෑදී අබලන් වී ඇති බැවින් එම මාර්ගයේ ඇති වලවල් වල පස් පුරවා මාර්ග ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. එම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන  මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන්  මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අබලන් වී ඇති මහියංගන පාරේ 6 කණුව සිට විනියමුල්ල එගොඩවෙල මාර්ගය හා හෙනගහවෙල පත්තගහරාව දක්වා ඇති හෙනගහවෙල වෙල මාර්ගය  ප්‍රතිසංස්කරණය කිරීමේදී මෙම මාර්ගයේ සෑදී ඇති වලවල් පිරවීම සඳහා පස් අවශ්‍ය බැවින් එම පස් මිලදී ගෙන මෙම මාර්ගය ඉදි කිරීමට සිදුවන බැවින් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පළාත් මාර්ග දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ  යෝජනාව හා තීරණය  සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.05. හිඟ කුලී මුදල් හා ප්‍රමාද ගාස්තු ගෙවූ  A02, A05, B02 , B03 කඩ කාමර සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් A02, A04, A05 ,B02, B03, B05  යන කඩ කාමරවල බඳු කරුවන් හිඟ කුලී මුදල් හා ප්‍රමාද ගාස්තු නොගෙවීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා 2025.06.24 දින **05.01.05** යෝජනාව ඉදිරිපත් කරන ලදී. එහිදී තීරණ අංක 05.01.05 මඟින් හිඟ කඩකුලී මුදල් නොගෙවන ලද බඳුකරුවන් හට හිඟකුලී මුදල්  හා ප්‍රමාද ගාස්තු සති දෙකක කාලය තුළ එනම් 2025.07.21 දින වන විට ගෙවා අවසන් කරන ලෙසට ලිඛිතව  දැනුවත් කරන ලෙසට දන්වා ඇත. ඒ අනුව,

2025.07.11 දින වනවිට

- A 02 - එච්.එම්. බෝධිවංශ ගුණසේකර මයා
- A 05 - වයි.එම්. ශාන්ත කුමාර මයා
- B 02 - කේ.පී. අල්විස් මයා

යන බදුකරුවන් හිඟ කුලී මුදල් හා ප්‍රමාද ගාස්තු ගෙවා අවසන් කර ඇත. මෙම කඩ කාමර 2025 මාර්තු මස දක්වා කුලී මුදල් ගෙවීම් කර අවසන් කර ඇති අතර මෙම කඩ කාමර සඳහා 2025 අප්‍රේල් මස සිට බිල් කිරීම්ද නවතා ඇති බැවින් මෙම A02, A05, B02 බදුකරුවන්ගෙන් 2025 අප්‍රේල් මාසයේ සිට මේ දක්වා හිඟ ගාස්තු සහ ප්‍රමාද ගාස්තු අයකර 2025 අප්‍රේල් මස සිට නව ගිවිසුම් වලට එළඹ එම බදුකරුවන්ටම බදු ලබාදීම සඳහා 2025.07.22 දින ගරු සභාවට 05.01.10 මඟින් යෝජනා කළ අතර එහිදී මෙම යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කර නැවත ඊළඟ මහ සභාව සඳහා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

තවද B03 කඩ කාමරය බදු ලබාගෙන සිටි කේ.එම්.සුමනාවතී මියද 2025.07.22 සම්පූර්ණ හිඟ ගාස්තු සහ ප්‍රමාද ගාස්තු ගෙවා අවසන් කර ඇති බැවින් එම කඩ කාමරය ද බදුදීම පිළිබඳව නිර්දේශ ලබා ගැනීම සඳහා 2025.07.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කර ඇත.

එහිදී මෙම A02, A05, B02, B03 කඩ කාමර සම්බන්ධයෙන් නීතිමය පියවරක් ගැනීමේදී නඩුවක් වසර ගණනාවක් ඉදිරියට දිගු වියහැකි බැවින් එහි තීන්දුව ලැබෙන තෙක් එම කඩ හිමියන් හට ප්‍රාදේශීය සභාවට කිසිඳු ගෙවීමක් නොකර වෙළඳාම් කිරීමට අවසර ලැබේ. තවද සභාව මගින් නඩු ගාස්තු ලෙස විශාල මුදලක් වැය කිරීමට ද සිදුවන බැවින්, මෙම කරුණු පිළිබඳ සලකා බලා බිබිල ප්‍රාදේශීය සභාවට අයත් A02, A05, B02 , B03 කඩ කාමර හතර සඳහා අදාළ බදුකරුවන්ගෙන් 2025 අප්‍රේල් මාසයේ සිට මේ දක්වා හිඟ කුලී මුදල් සහ ප්‍රමාද ගාස්තු අයකර 2025 අප්‍රේල් මස සිට නව ගිවිසුමකට එළඹ එම පැරණි බදුකරුවන් හටම බදු ලබා දීමට සුදුසු බව 2025.07.30 දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කර ඇත.

එබැවින් බිබිල ප්‍රාදේශීය සභාවට අයත් A02, A05, B02 B03 කඩ කාමර ලබා ගෙන ඇති බදුකරුවන්ගෙන් 2025 අප්‍රේල් මාසයේ සිට මේ දක්වා හිඟ ගාස්තු සහ ප්‍රමාද ගාස්තු අයකර 2025 අප්‍රේල් මස සිට නව ගිවිසුමකට එළඹ එම පැරණි බදුකරුවන් හටම ලබා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2025 මාර්තු මස දක්වා A02, A05, B02 , B03 කඩ කාමරවල බදුකරුවන් කුලී මුදල් හා ප්‍රමාද ගාස්තු ගෙවා අවසන් කර ඇත. නමුත් 2025 මාර්තු මස දක්වා හිඟ කඩකුලී හා ප්‍රමාද ගාස්තු ගෙවීමට ඇති A04, B05 කඩ කාමර වල බදුකරුවන්ට මුදල් ගෙවන ලෙස නැවතත් දැනුම් දීමක් කර මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස තීරණය කළ අතර අප්‍රේල් මස සිට A02, A04, A05, B02, B03, B05කඩ කාමරවල ගිවිසුම් අවලංගු කර බිල් කිරීම නවතා ඇති බැවින් අප්‍රේල් මස සිට මේ දක්වා මාසික කුලිය හා ප්‍රමාද ගාස්තු මෙම බදුකරුවන්ගෙන් සභාවට අයවීමට ඇති බැවින් සභාවේ අරමුදල් වලට හානියක් නොවන ආකාරයට හා දෛනික කටයුතු වලට මුදල් ලබා ගැනීමේ අරමුණුව හා මෙම ස්ථානයේ ව්‍යාපාරික කටයුතු දිගු කලක් සිදු කරගෙන ගිය බදුකරුවන් යම් අපහසුතාවයකට පත්වේ නම් ඉන් ඔවුන් මුදවා ගැනීමේ පදනමින් මෙම කඩ කාමර නව තක්සේරුවක් සිදු කරන තෙක් බදුකරුවන්ගෙන් අප්‍රේල් මස සිට මේ දක්වා මාසික කුලිය හා ප්‍රමාද ගාස්තු  අයකිරීමට හා නව බදු ගිවිසුමට එළඹ මෙම බදුකරුවන්හටම කඩ කාමර බදු ලබාදීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ  යෝජනාව හා තීරණය  සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.06. බිබිල සතිපොළ E කඩ කාමර සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව සතු බිබිල සතිපොළ ගොඩනැගිල්ලේ E කඩ කාමර 13ක් ඇත.එම කඩකාමරවල ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට ප්‍රමාණවත් මුදලක් ප්‍රාදේශිය සභාව සතුව නොමැති බැවින්  එම කඩ කාමර ටෙන්ඩර් කිරීමෙන් පසු ලැබෙන කීමනි මුදලින් අදාළ කඩ කාමරවල ඉතිරි වැඩ අවසන් කිරීම සුදුසු බවටත් 2025.06.30 දිනැතිව ආදායම් පරීක්ෂක මහතා විසින් ලිඛිතව දැනුවත් කර ඇත. ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් අනුමත කර ඇත.

බිබිල සතිපොළ E කඩකාමර 11ක් සඳහා පමණක් බදු ගිවිසුමක් ඇති අතර E12 සහ  E13 කඩ කාමර සඳහා ගිවිසුම් නොමැත. එසේම මෙම කඩකාමර සඳහා කීමනි මුදල සහ මාසික කුලී මුදල තීරණය කිරීමට නම් මෙම කඩ කාමර බදු ලබාදෙනු ලබන  කාලය කොපමණද යන්න තීරණය කළ යුතුයි.

මෙම කඩ කාමර වසර 03කට වඩා වැඩි කාලයක් සඳහා බදු ලබා දෙන්නේ නම් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (XII) වගන්තිය අනුව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වේ.

2013 ජුනි 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පොදු හා පෞද්ගලික වෙළඳපොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ 41 වගන්තියේ (iii) අනුව පැරණි වෙළඳපොළ ගොඩනැගිල්ලක් පැවති ස්ථානයක නව වෙළඳසැලක් ඉදිකළ පසු පැරණි වෙළඳසැලෙහි බදුකරුවන් විසින් එම ගොඩනැගිල්ලෙන් කඩකාමර ඉල්ලා සිටින්නේ නම් ඔවුන් වෙත එම කඩ කාමර ලබා දියයුතුය.

මෙම කඩ කාමර ටෙන්ඩර් කිරීමේදී ලබා ගනු ලබන කීමනි මුදලින් කාමරවල වැඩ අවසන් කරන්නේ නම් කඩ කාමරවල ඉදිකිරීම් අවසන් කර බඳුකරුවන්ට භාර දෙනු ලබන්නේ කොපමණ කාලසීමාවකින්ද යන්න බඳුකරු දැනුවත් කිරීමක්ද සිදුකළ යුතුය.

මෙම E කඩ කාමර බඳු ලබාදීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා 2025.07.22 දින 05.01.11.මගින් ගරු සභාවට යෝජනා කළ අතර එහිදී මෙම යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කර නැවත ඊළඟ මහ සභාව සඳහා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

බිබිල සතිපොළ *E* කඩකාමර 13 සඳහා කීමනි මුදලක් ලබාගෙන එම කඩකාමර වල වැඩ අවසන් කිරීම සුදුසු බවද බදු ලබාදෙන කාලය වසර 03 ක් ලෙසත්, වැඩ අවසන් කර එම කඩ කාමර තක්සේරු කරන තුරු එක් කඩකාමරයක් සඳහා කීමනි මුදල රු.50,000.00 ක් ලෙසත් මාසික කුලී මුදල රු.1,000.00 ලෙසත් අයකිරීමටත් මෙම *E* කඩකාමර මාස 02 කින් වැඩ අවසන් කිරීමටත් එම මාස දෙක සඳහා මාසික කුලී මුදල් අය නොකිරීමටත් එම කඩකාමර වල වැඩ අවසන් වූ පසු තක්සේරු කටයුතු සඳහා යොමු කිරීමත් සුදුසු බව 2025.07.30 දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

ඒ අනුව බිබිල සතිපොළ *E* කඩකාමර සම්බන්ධයෙන් 2025.07.30 දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශය අනුව කටයුතු කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

බිබිල සතිපොළ *E* කඩකාමර 13 සඳහා කීමනි මුදලක් ලබාගෙන එම කඩකාමර වල වැඩ අවසන් කිරීම සුදුසු බවද බදු ලබාදෙන කාලය වසර 03 ක් ලෙසත්, වැඩ අවසන් කර එම කඩ කාමර තක්සේරු කරන තුරු එක් කඩකාමරයක් සඳහා කීමනි මුදල රු.50,000.00 ක් ලෙසත් මාසික කුලී මුදල රු.1,000.00 ලෙසත් අයකිරීමටත් මෙම *E* කඩකාමර මාස 02 කින් වැඩ අවසන් කිරීමටත් එම මාස දෙක සඳහා මාසික කුලී මුදල් අය නොකිරීමටත් එම කඩකාමර වල වැඩ අවසන් වූ පසු තක්සේරු කටයුතු සඳහා යොමු කිරීම සඳහා කොමසාරිස්තුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන කටයුතු කිරිමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.07. 2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශීය සභාව සතු දේපල ප්‍රසම්පාදන මගින් බදු දීම.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපල වාර්ෂිකව ප්‍රසම්පාදන මගින් බදු දෙනු ලබයි. ඒ අනුව 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදන මගින් බදු ලබාදෙන දේපල පහත පරිදි වේ.

| අනු අංකය | දේපල | 2025 වාර්ෂික බදු මුදල |
|---|---|---|
| 01 | බිබිල සතිපොළ | 2,822,222.28 |
| 02 | පිටකුඹුර සතිපොළ | 270,600.00 |
| 03 | බිබිල එළගව මස් වෙළඳසැල | 2,006,000.00 |
| 04 | අංක 01 මුහුදු මාළු වෙළඳසැල | 1,047,000.00 |
| 05 | අංක 02 මුහුදු මාළු වෙළඳසැල | 518,000.00 |
| 06 | අංක 03 මුහුදු මාළු වෙළඳසැල | 947,000.00 |
| 07 | මිරිදිය මාළු වෙළඳසැල | 347,000.00 |
| 08 | ඌරු මස් වෙළඳසැල | 690,000.00 |
| 09 | කරවල වෙළඳ සැල | ඉල්ලුම් කර නැත |
| 10 | අංක 01 කුකුළු මස් වෙළඳසැල | 763,000.00 |
| 11 | අංක 02 කුකුළු මස් වෙළඳසැල | ඉල්ලුම් කර නැත |
| 12 | අංක 03 කුකුළු මස් වෙළඳසැල | 510,100.00 |
| 13 | උඩුබුබුල විවේකාංගනය | 78,240.00 |
| 14 | බස්නැවතුම්පොළ අසල වැසිකිලිය | 300,050.00 |
| 15 | බිබිල සතිපොළ අසල වැසිකිලිය | ඉල්ලුම් කර නැත |

- අංක 02 කුකුළු මස් වෙළඳසැල /බිබිල සතිපොළ අසල වැසිකිලිය සහ කරවල වෙළඳසැල සිව් වතාවක් ප්‍රසම්පාදනය කළ නමුත් ප්‍රසම්පාදනය වී නැත. අංක 01 කුකුළුමස් වෙළඳසැල 2025.04.30 දින සිට නැවත සභාවට භාර දී ඇත. ඒ අනුව එම වෙළඳසැල නැවත වරක් ප්‍රසම්පාදනය කළ නමුත් ප්‍රසම්පාදනය නොවුනි.

**මෙම වෙළඳ සැල් සඳහා 2025 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද අවම ලංසුව හා එම වෙළඳසැල් බදුකරුවන් විසින් ඉල්ලුම් කළ වැඩිම වාර්ෂික බදු මුදල පහත පරිදි වේ.**

| අනු අංකය | දේපල | අවම ලංසුව (2025 වර්ෂයේ තක්සේරු වටිනාකම) | 2025 ඉල්ලුම් කළ වැඩිම මුදල | වෙනත් |
|---|---|---|---|---|
| 1 | බිබිල සතිපොළ | 1,800,000.00 | 2,822,222.28 | - |
| 2 | පිටකුඹුර සතිපොළ | 270,000.00 | 270,600.00 | - |
| 3 | බිබිල එළ ගවමස් වෙළඳසැල | 2,000,000.00 | 2,006,000.00 | - |
| 4 | අංක 01 මුහුදු මාළු වෙළඳසැල | 1,045,000.00 | 1,047,000.00 | - |
| 5 | අංක 02 මුහුදු මාළු වෙළඳසැල | 516,000.00 | 518,000.00 | - |

| | | | | |
|---|---|---|---|---|
| 6 | අංක 03 මුහුදු මාළු වෙළඳසැල | 945,000.00 | 947,000.00 | - |
| 7 | මිරිදිය මාළු වෙළඳසැල | 345,000.00 | 347,000.00 | - |
| 8 | ඌරු මස් වෙළඳසැල | 687,500.00 | 690,000.00 | - |
| 9 | කරවල වෙළඳසැල | 58,000.00 | 00 | මෙම වෙළඳසැල සිව් වතාවක් ප්‍රසම්පාදනය කළ නමුත් ප්‍රසම්පාදනය වී නැත |
| 10 | අංක 01 කුකුළු මස් වෙළඳසැල | 473,000.00 | 651,500.00 | 2025 .04.30 දින සිට නැවත සභාවට භාර දී ඇත |
| 11 | අංක 02 කුකුළු මස් වෙළඳසැල | 470,000.00 | 00 | මෙම වෙළඳසැල සිව් වතාවක් ප්‍රසම්පාදනය කළ නමුත් ප්‍රසම්පාදනය වී නැත |
| 12 | අංක 03 කුකුළු මස් වෙළඳසැල | 420,000.00 | 510,100.00 | - |
| 13 | උඩුබුබුල විවේකාංගනය | 78,000.00 | 78,240.00 | - |
| 14 | බිබිල සතිපොළ අසල වැසිකිලිය | 60,000.00 | 00 | මෙම වැසිකිලිය සිව් වතාවක් ප්‍රසම්පාදනය කළ නමුත් ප්‍රසම්පාදනය වී නැත |
| 15 | බස් නැවතුම්පොළ පොදු වැසිකිලිය | 300,000.00 | 300,050.00 | - |

මෙම උක්ත දේපල 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදනය කර බදු ලබා දීමට අනුමැතිය ලබාදීම සඳහා 2025.07.22 දින 05.01.16 මගින් ගරු සභාවට යෝජනා කළ අතර බිබිල ප්‍රාදේශීය සභාව සතු දේපල 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදනය මගින් බදු ලබාදීමේදී මෙම දේපල වල අවම ලංසුව සඳහා (2025 වර්ෂයේ තක්සේරු වටිනාකම) බද්දක් එකතු කර වටිනාකම වැඩි කරන්නේද තිබෙන ලංසුව යටතේම බදු ලබා දෙන්නේද සමාජ සුභ සාධනය සඳහා යොදවන්නේද යන්න මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් සාකච්ඡා කර නැවත ඊළඟ සභා වාරය සඳහා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව බිබිල ප්‍රාදේශීය සභාව සතු දේපල 2025.07.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කළයුතු ආකාරය පිළිබඳ නිර්දේශ කළ අතර එම පහත ආකාරයට බදු දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ. | දේපළ | 2025 වර්ෂයේ තක්සේරු වටිනාකම (අවම ලංසු මුදල) | 2025 වාර්ෂික බදු මුදල (ඉල්ලුම් කළ වැඩිම මුදල) | 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීම සිදු කළ යුතු ආකාරය | 2026 වර්ෂයට යෝජිත අවම ලංසු මුදල |
|---|---|---|---|---|---|
| 01 | බිබිල සතිපොළ | රු.1,800,000.00 | රු.2,822,222.28 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.2,963,333.39 |
| 02 | පිටකුඹුර සතිපොළ | රු.270,000.00 | රු.270,600.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.284,130.00 |
| 03 | බිබිල එළ ගවමස් වෙළඳසැල | රු.2,000,000.00 | රු.2,006,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 10% ක් එකතුකිරීම | රු.2,206,600.00 |
| 04 | අංක 01 මුහුදු මාළු වෙළඳසැල | රු.1,045,000.00 | රු.1,047,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.1,099,350.00 |
| 05 | අංක 02 මුහුදු මාළු වෙළඳසැල | රු.516,000.00 | රු.518,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.543,900.00 |
| 06 | අංක 03 මුහුදු මාළු වෙළඳසැල | රු.945,000.00 | රු.947,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.994,350.00 |
| 07 | මිරිදිය මාළු වෙළඳසැල | රු.345,000.00 | රු.347,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.364,350.00 |
| 08 | ඌරු මස් වෙළඳසැල | රු.687,500.00 | රු.690,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.724,500.00 |
| 09 | කරවල වෙළඳසැල | රු.58,000.00 | 00 | 2025 තක්සේරු වටිනාකම අනුව | රු.58,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | අංක 01 කුකුළු මස් වෙළඳසැල | රු.473,000.00 | රු.651,500.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.684,075.00 |
| 11 | අංක 02 කුකුළු මස් වෙළඳසැල | රු.470,000.00 | 00 | 2025 තක්සේරු වටිනාකම අනුව | රු.470,000.00 |
| 12 | අංක 03 කුකුළු මස් වෙළඳසැල | රු.420,000.00 | රු.510,100.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.535,605.00 |
| 13 | උඩුබුබුල විවේකාංගණය | රු.78,000.00 | රු.78,240.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.82,152.00 |
| 14 | බිබිල සතිපොළ අසල වැසිකිලිය | රු.60,000.00 | 00 | ටෙන්ඩර් නොකිරීම | නොමිලේ සේවාව ලබාදීම |
| 15 | බස් නැවතුපොළ පොදු පොදු වැසිකිළිය | රු.300,000.00 | රු.300,050.00 | 2025 වාර්ෂික බදු මුදල අනුව | රු.300,050.00 |

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී පී.කේ.ඩී.පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව සතු ප්‍රසම්පාදනය කර බදු ලබා දෙනු ලබන දේපල වලින්

01. බිබිල සතිපොළ
02. පිටකුඹුර සතිපොළ
03. බිබිල එළ ගවමස් වෙළඳසැල
04. අංක 01 මුහුදු මාළු වෙළඳසැල
05. අංක 02 මුහුදු මාළු වෙළඳසැල

06. අංක 03 මුහුදු මාළු වෙළඳසැල
07. මිරිදිය මාළු වෙළඳසැල
08. ඌරු මස් වෙළඳසැල
09. කරවල වෙළඳසැල
10. අංක 01 කුකුළු මස් වෙළඳසැල
11. අංක 02 කුකුළු මස් වෙළඳසැල
12. අංක 03 කුකුළු මස් වෙළඳසැල
13. උඩු බුබුල විවේකාංගනය
14. බස් නැවතුම්පොල පොදු වැසිකිලිය

යන දේපල 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදනය කර බදු ලබාදීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කිරීමටත් එම තක්සේරු වටිනාකම (අවම ලංසු මුදල) අනුව ටෙන්ඩර් කර බදු ලබාදීමටත් **බිබිල සතිපොළ අසල වැසිකිලිය** සමාජ සුභ සාධනය සඳහා යෙදවීමටත් සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.08. බිබිල ප්‍රාදේශීය සභාව සතු දොඩම්ගොල්ල අංක 02 කඩකාමරය පැවරීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාව සතු දොඩම්ගොල්ල අංක 02 කඩ කාමරය බිබිල, දොඩම්ගොල්ල, පන්සල පාර, අංක 02 ලිපිනයෙහි පදිංචි රාජමුණිලාගේ මානෙල් කුමුදුනී ස්වර්ණලතා යන අය විසින් බඳු ලබාගෙන ඇත. මෙම කඩකාමරය බිබිල, දොඩම්ගොල්ල, පන්සල පාර අංක 02 ලිපිනයේ පදිංචි නුවර පක්ෂගේ සත්‍යා රවිහාරී තිලකරත්න සිය දියණියට පවරා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත.

2013.06.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි IV (අ) වැනි කොටස පළාත් සභා පළාත් පාලන නිවේදන සම්මත අතුරු ව්‍යවස්ථාවේ පොදු හෝ පෞද්ගලික වෙළඳපොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අංක 40 පහත පරිදි වේ.

" 36 වගන්තියේ සිට 39 වගන්තිය දක්වා වන අතුරු ව්‍යවස්ථාවල කුමක් සඳහන්ව තිබුණද ප්‍රාදේශීය සභාව කිසියම් කඩ කාමරයක බදුකරුවකුගේ ඉල්ලීමක් මත හෝ බදුකරුවකු මියගිය අවස්ථාවක හෝ එකී බදුකරුගේ කාලත්‍රයාට හෝ දරුවකුට එකී කඩකාමරයේ බදු අයිතිය පවරා දීමට එකී අතුරු ව්‍යවස්ථාවල බාධාවක් නොවිය යුතුය. එසේ දෙන ලද තැනැත්තා සභාව සමඟ නව බදු ගිවිසුමකට එළඹිය යුතුය. "

මව රාජමුණිලාගේ මානෙල් ස්වර්ණලතා රාජමුණි හා නුවර පක්ෂගේ තිළිණ නුවන් තිලකරත්න, නුවර පක්ෂගේ තක්ෂිලා නෙත්මිණි තිලකරත්න, නුවර පක්ෂගේ චමුදි තරුෂිකා තිලකරත්න යන සොයුරු සොයුරියන්ද මෙම කඩ කාමරය නුවර පක්ෂගේ සත්‍යා රවිහාරී තිලකරත්න යන අයට පැවරීමට කැමැති බව දිවුරුම් ප්‍රකාශ මගින් ඉදිරිපත් කර ඇත. මෙම කඩකාමරය නුවර පක්ෂගේ සත්‍යා රවිහාරී තිලකරත්න පැවරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කර සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.09. බිබිල නව සතිපොළ ගොඩනැගිල්ලේ F02 සහ F04 කඩ කාමර ටෙන්ඩර් කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව සතු බිබිල සතිපොළ ගොඩනැගිල්ලේ F ශ්‍රේණියේ කඩ කාමර 09ක් ඇති අතර ඉන් කඩ කාමර 07ක් මේ වන විට බඳු ලබාදී ඇත. F02 සහ F04 කඩකාමර මේ දක්වා බඳු ලබාදී නොමැති අතර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අංක MO/RP/807 හා 2025.05.20 දිනැතිව මෙම කඩ කාමර ටෙන්ඩර් කර බඳු ලබාදීම සඳහා ලංසු මුදල හා මාසික කුලී මුදල සම්බන්ධයෙන් තක්සේරු වාර්තාව ලැබී ඇත.

| අනු අංකය | කඩ කාමර අංකය | ආපසු නොගෙවන අත රුදවුම් මුදල (රු.) (Key Money) | ආපසු නොගෙවන අතරුදවුම් මුදලට යටත් මාසික වෙළඳපල කුලිය (රු.) |
|---|---|---|---|
| 01 | F02 | 1,000,000.00 | 1,700.00 |
| 02 | F04 | 1,000,000.00 | 1,700.00 |

ඒ අනුව ටෙන්ඩර් කර බඳු ලබාදීම සම්බන්ධයෙන් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් සාකච්ඡා කර නැවත ඊළඟ සභා වාරය සඳහා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

බිබිල සතිපොළ ගොඩනැගිල්ලේ F02 සහ F04 කඩකාමර දෙක සඳහා ගිවිසුම් කාලය අවුරුදු 03ක් දක්වා අඩු කිරීමටත් මෙම කඩ කාමර නැවත තක්සේරු කරන තුරු එක් කඩ කාමරයක් සඳහා ආපසු නොගෙවන අතරුදවුම් මුදල (කීමනි) රු.100,000.00 ක් ලෙස හා මාසික කුලී මුදල රු.1900.00ක් වශයෙන් අය කිරීමේ පදනම මත ටෙන්ඩර් කිරීමටත් මෙම කඩ කාමර වසර 03න් 03ට තක්සේරු වාර්තා ලබා ගෙන ඒ අනුව කුලී අය කිරීමේ කටයුතු සිදු කිරීමටත් සුදුසු බව 2025.07.30 දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කර ඇත.

එබැවින් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශය අනුව බිබිල සතිපොළ ගොඩනැගිල්ලේ F02 සහ F04 කඩකාමර ටෙන්ඩර් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත

අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අංක MO/RP/807 හා 2025.05.20 දිනැතිව මෙම F02 සහ F04 කඩ කාමර ටෙන්ඩර් කර බඳු ලබාදීම සඳහා ලංසු මුදල හා මාසික කුලී මුදල සම්බන්ධයෙන් ලබා දී ඇති තක්සේරු වාර්තාව අනුව ටෙන්ඩර් කර බඳු ලබාදීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.10. කාබණික පොහොර ට්‍රැක්ටර් ලෝඩ් 01ක මිල තීරණය කිරීම සඳහා

බිබිල ප්‍රාදේශීය සභාව මගින් කසළ කළමණාකරන ව්‍යාපෘතිය මගින් කාබණික පොහොර අලෙවි කර ආදායම් උත්පාදනය කරනු ලබයි. එම පොහොර අලෙවිය පහත ආකාරයෙන් සිදුකරයි.

- පැකැට් කළ කාබණික පොහොර 1 Kg ක් - රු.40.00
- පැකැට් නොකළ කාබණික පොහොර 1 Kg ක් - රු.25.00

කාබණික පොහොර ට්‍රැකටර් ලොඞ් 01ක් වැනි විශාල ප්‍රමාණයක් එකවිට ලබා ගැනීම සඳහා ජනතාව නිතර ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලුම් කරමින් පැමිණෙන අතර ඒ අය පොහොර 1 Kgක් රු.25.00 කට මිලදී ගැනීමට අකමැතිව ප්‍රතික්ෂේප කරනු ලබයි. එබැවින් ප්‍රාදේශීය සභාවට අයවීමට ඇති විශාල මුදලක් අහිමි වී යන බැවින් කාබණික පොහොර කි.500 කට වඩා ඉල්ලුම්කරන අයෙකු වෙත ලබා දෙන තොග විකුණුම් මිලක් තීරණය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව මගින් නිෂ්පාදනය කරනු ලබන කාබණික පොහොර සඳහා විශාල ඉල්ලුමක් තිබෙන බැවින් ට්‍රැක්ටර් ලෝඩ් 1ක් මිලදී ගන්නන් හට පොහොර 1 Kgක් රු.25.00 බැගින්ම අලෙවි කිරීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.11 තාවකාලික පදනම මත දෛනික වැටුප් ලබන සේවකයින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට සාමාජික කිරීම සම්බන්ධවයි.

තාවකාලික හෝ දෛනික වැටුප් ගෙවීමේ පදනමින් බඳවා ගන්නා සෑම අයෙකුම සේවා නියුත්තිකයන්ගේ භාර අරමුදලට දායක කර ගත යුතු බව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 7/2015 හා 2015.07.23 මඟින් දන්වා ඇත. ඒ අනුව මෙම ආයතනයේ සේවයේ නියුතු පහත නම් සඳහන් සේවකයින් මෙතෙක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ලියාපදිංචි කර නොමැති අතර ඒ පිළිබඳව සාකච්ඡා කර ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ තීරණය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | නම | තනතුර | සේවයට බැඳුණු දිනය |
|---|---|---|---|
| 01 | ඩී.එම්.සිරිල් දිසානායක මයා | තාවකාලික ට්‍රැක්ටර් රථ රියදුරු | 2020.10.07 |
| 02 | ආර්.එම්. ගුණපාල මයා | තාවකාලික සෞඛ්‍ය කම්කරු | 2017.01.02 |
| 03 | කේ.එම්. සරත් පියසෝම මයා | තාවකාලික ක්ෂේත්‍ර කම්කරු | 2021.02.20 |
| 04 | ඒ.එම්. ධනුෂ්ක සංධීර ධර්මසිරි මයා | තාවකාලික සෞඛ්‍ය කම්කරු | 2021.03.09 |
| 05 | ඒ.ඒම්. හරිස්චන්ද්‍ර මයා | තාවකාලික සෞඛ්‍ය කම්කරු | 2021.03.09 |
| 06 | එල්.ඒ.බී. තුසිත කුමාර මයා | තාවකාලික සෞඛ්‍ය කම්කරු | 2022.02.21 |
| 07 | ඩී.එම්. ප්‍රවින් රංගන මයා | තාවකාලික සෞඛ්‍ය කම්කරු | 2021.03.09 |
| 08 | ඩී.එම්. රෝහිත දිසානායක මයා | තාවකාලික ක්ෂේත්‍ර කම්කරු | 2021.03.19 |
| 09 | ඒ. ප්‍රියන්ත එදිරිසිංහ මයා | තාවකාලික සෞඛ්‍ය කම්කරු | 2022.02.21 |
| 10 | ඩබ්.එම්. පූර්ණ ලක්ෂාන් මයා | තාවකාලික ට්‍රැක්ටර් රථ රියදුරු | 2021.06.09 |
| 11 | ටී.බී. අජිත් ඉන්දික ප්‍රසන්න මයා | තාවකාලික මුරකරු | 2022.07.19 |
| 12 | ඒ.එම්. සුදර්ශනි මධුෂානි ගුණසේකර මිය | තාවකාලික පුස්තකාල සහයක | 2021.02.19 |
| 13 | ඩී.ඩබ්. උදාරි ලක්ෂිකා ආරියදාස මිය | තාවකාලික පුස්තකාල සහයක | 2021.03.23 |
| 14 | පී.ඒ. විරාජ් ශාණුක පඩිකාර මයා | තාවකාලික පුස්තකාල සහයක | 2021.12.01 |
| 15 | ඩී.එම්. සුමනකුමාර මයා | තාවකාලික ක්ෂේත්‍ර කම්කරු | 2021.12.09 |
| 16 | එල්.ඒ.බී. සේනාධීර උදයංග මයා | තාවකාලික ක්ෂේත්‍ර කම්කරු | 2022.04.21 |
| 17 | ආර්.එම්. විජේරත්න මයා | තාවකාලික ක්ෂේත්‍ර කම්කරු | 2022.01.31 |
| 18 | ඩී.එම්. නලින්ද අයොන් ප්‍රියදර්ශන මයා | තාවකාලික මුරකරු | 2022.07.19 |
| 19 | ඒල්.ඒ.බී.එම්. සම්පත් කුමාර මයා | තාවකාලික ක්ෂේත්‍ර කම්කරු | 2023.07.24 |
| 20 | එන්. චමිලා ලසන්ති මිය | තාවකාලික පෙර පාසල් ගුරු | 2023.11.01 |
| 21 | ඩී.ඒම්. ඉරෝෂන් සම්පත් මයා | තාවකාලික සෞඛ්‍ය කම්කරු | 2022.02.21 |

| | | | |
|---|---|---|---|
| 22 | ආර්.ටී.පී.ඒස්. ගීතනාත් මධුශංක මයා | තාවකාලික මුරකරු | 2024.02.01 |

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කර සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.12. කතෝලික සුසාන භූමිය සඳහා ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමියෙන් ඉඩම් කොටසක් ඉල්ලුම් කිරීම සම්බන්ධවයි.

බිබිල බදුල්ල මාර්ගයේ පිහිටි ශුද්ධ වූ පවුලේ කතෝලික දේවස්ථානයට බිබිල නගරය, නන්නපුරාව, දියකොබල හා බිබිල වතුයාය යන ප්‍රදේශ අයත් වන අතර ඒවායෙහි මුළු කතෝලික පවුල් සංඛ්‍යාව පවුල් 80ක් හා එහි සාමාජිකයින් 400ක් පමණ වේ. මෙම කතෝලික ජනතාව මියගිය පසු භූමදානය කිරීම සඳහා දැනට ඇති කුඩා භූමි ප්‍රමාණය ඇහිරී ගොස් ඇති බැවින් යාබඳ ඉඩම වන බිබිල ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමියෙන් පර්චස් 30ක කොටසක් ලබා දෙන ලෙස මීසම් භාර පියතුමා විසින් ඉල්ලුම් කර ඇත. ඒ පිළබඳව සුදුසු තීරණයක් ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කතෝලික ජනතාව මියගිය පසු භූමදානය කිරීම සඳහා බිබිල ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමියෙන් පර්චස් 30ක කොටසක් කතෝලික දේවස්ථානයට පවරා නොදී මෙම ප්‍රාදේශිය සභාව සතු සුසාන භූමියෙහි කතෝලික බැතිමතුන්ද වල නොබැද තැම්පත් කර භූමදානය කර කුරුස සළකුණ පමණක් එහි සවි කිරීමට අවස්ථාව ලබාදීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.13.මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධවයි.

2025.07.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

01.බිබිල සතිපොළ ගොඩනැගිල්ලේ F 02 සහ F 04 කඩකාමර දෙක සඳහා ගිවිසුම් කාලය අවුරුදු 03 ක් දක්වා අඩු කිරීමටත් මෙම කඩකාමර නැවත තක්සේරු කරන තුරු එක් කඩකාමරයක් සඳහා ආපසු නොගෙවන අතරුදවුම් මුදල රු.100,000.00 ක් ලෙස හා මාසික කුලී මුදල රු.1,900.00 ක් වශයෙන් අය කිරීමේ පදනම මත ටෙන්ඩර් කිරීමටත් කඩකාමර වසර 03 න් 03 ට තක්සේරුකර වාර්තා ලබාගෙන ඒ අනුව කුලිය අයකිරීමේ කටයුතු සිදු කිරීම

02.බිබිල ප්‍රාදේශීය සභාව සතු මෙම දේපළ පහත සඳහන් පරිදි 2026 වර්ෂය සඳහා බදුදීම.

| අ.අ. | දේපළ | 2025 වර්ෂයේ තක්සේරු වටිනාකම (අවම ලංසු මුදල) | 2025 වාර්ෂික බදු මුදල (ඉල්ලුම් කළ වැඩිම මුදල) | 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීම සිදු කළ යුතු ආකාරය | 2026 වර්ෂයට යෝජිත අවම ලංසු මුදල |
|---|---|---|---|---|---|
| 01 | බිබිල සතිපොළ | රු.1,800,000.00 | රු.2,822,222.28 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.2,963,333.39 |
| 02 | පිටකුඹුර සතිපොළ | රු.270,000.00 | රු.270,600.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.284,130.00 |
| 03 | බිබිල එළ ගවමස් වෙළඳසැල | රු.2,000,000.00 | රු.2,006,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 10% ක් එකතුකිරීම | රු.2,206,600.00 |
| 04 | අංක 01 මුහුදු මාළු වෙළඳසැල | රු.1,045,000.00 | රු.1,047,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.1,099,350.00 |
| 05 | අංක 02 මුහුදු මාළු වෙළඳසැල | රු.516,000.00 | රු.518,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.543,900.00 |
| 06 | අංක 03 මුහුදු මාළු වෙළඳසැල | රු.945,000.00 | රු.947,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.994,350.00 |
| 07 | මිරිදිය මාළු වෙළඳසැල | රු.345,000.00 | රු.347,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.364,350.00 |
| 08 | ඌරු මස් වෙළඳසැල | රු.687,500.00 | රු.690,000.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.724,500.00 |
| 09 | කරවල වෙළඳසැල | රු.58,000.00 | 00 | 2025 තක්සේරු වටිනාකම අනුව | රු.58,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | අංක 01 කුකුළු මස් වෙළඳසැල | රු.473,000.00 | රු.651,500.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.684,075.00 |
| 11 | අංක 02 කුකුළු මස් වෙළඳසැල | රු.470,000.00 | 00 | 2025 තක්සේරු වටිනාකම අනුව | රු.470,000.00 |
| 12 | අංක 03 කුකුළු මස් වෙළඳසැල | රු.420,000.00 | රු.510,100.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.535,605.00 |
| 13 | උඩුබුබුල විවේකාංගණය | රු.78,000.00 | රු.78,240.00 | 2025 වාර්ෂික බදු මුදලට එම මුදලින් 5% ක් එකතුකිරීම | රු.82,152.00 |
| 14 | බිබිල සතිපොළ අසල වැසිකිලිය | රු.60,000.00 | 00 | ටෙන්ඩර් නොකිරීම | නොමිලේ සේවාව ලබාදීම |
| 15 | බස් නැවතුපොළ පොදු පොදු වැසිකිළිය | රු.300,000.00 | රු.300,050.00 | 2025 වාර්ෂික බදු මුදල අනුව | රු.300,050.00 |

03.බිබිල සතිපොළ E කඩකාමර සඳහා KEY MONEY ලබාගෙන එම කඩකාමර වල වැඩ අවසන් කර එම කඩකාමර  බදු ලබාදෙන කාලය වසර 03 ක් ලෙසත්, වැඩ අවසන් කර එම කඩකාමර තක්සේරු කරන තුරු එක් කඩකාමරයක් සඳහා KEY MONEY රු.50,000.00 ක් ලෙසත් මාසික කුලී මුදල රු.1,000.00 ලෙසත් අයකිරීමට හා මෙම E කඩකාමර මාස 02 කින් වැඩ අවසන් කිරීමටත් එම මාස දෙක සඳහා මාසික කුලී මුදල් අය නොකිරීමටත් එම කඩකාමර වල වැඩ අවසන් වූ පසු තක්සේරු කටයුතු සඳහා යොමු කිරීම.

04.A 02, A 05, B 02, B 03  යන කඩකාමර සම්බන්ධයෙන් එම කඩකාමර හතරෙහි බදුකරුවන්ගෙන් 2025 අප්‍රේල් මාසයේ සිට මේ දක්වා හිඟ කුලිය සහ ප්‍රමාද ගාස්තු අයකර 2025 අප්‍රේල් මස සිට නව ගිවිසුමකට එළඹ පැරණි බදුකරුවන් හටම බදු ලබාදීම.

05.බිබිල ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ ඉදිරිපස මාර්ගය කොන්ක්‍රීට් ගල් අල්ලා සකස් කිරීම සඳහා  අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා රු.95,000.00 ක මුදල් අත්තිකාරමක් කාර්මික නිලධාරි ටී.ආර්.එම්.සුලෝචනා සෙනෙවිරත්න මහත්මිය වෙත ලබාදීම

06.බිබිල ප්‍රාදේශීය සභාවේ ජල ගබඩාව සඳහා පහත සඳහන් උපාංග පහත ප්‍රමාණයන්ගෙන් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම

| අ.අ. | වර්ගය | මිලදී ගත යුතු ප්‍රමාණය |
|---|---|---|
| 01 | 20 mm Valve Socket | 50 |
| 02 | 20 mm Elbow | 50 |
| 03 | 20 mm Foucet Socket | 50 |
| 04 | 20 mm Equal Tee | 20 |
| 05 | 90 mm x 20 mm Clamp Saddle | 20 |

| | | |
|---|---|---|
| 06 | 50 mm x 20 mm Clamp Saddle | 20 |
| 07 | 32 mm x 20 mm Reducing Socket | 10 |
| 08 | 32 mm x 20 mm Reducing Tee | 10 |
| 09 | 40 mm x 20 mm Reducing Socket | 10 |
| 10 | 20 mm Tap | 20 |
| 11 | 12 mm Thread Seal Tape | 50 |
| 12 | 25 mm Thread Seal Tape | 20 |
| 13 | 50 mm Valve | 10 |
| 14 | 50 mm Valve Socket | 20 |
| 15 | 50 mm Repair Socket (Ring Type) | 05 |
| 16 | 90 mm x 63 Reducing Socket | 03 |
| 17 | 50 mm Rubber Ring | 00 |
| 18 | 63 mm Rubber Ring | 00 |
| 19 | 110 mm Rubber Ring | 00 |
| 20 | 160 mm Rubber Ring | 00 |
| 21 | Water Meter | 40 |
| 22 | Ferule | 30 |
| 23 | Lockable Valve | 30 |

07.බිබිල ප්‍රාදේශීය සභාවේ ආදායම් අංශය සඳහා BPS/03/03, BPS/03/07, BPS/03/08 යන විෂය නිලධාරීන් හට ලාච්චු සහිත ලී මේස 03 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

08.බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ පරිගණක යන්ත්‍ර අළුත්වැඩියා කිරීම් දැනට අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකරන සමාධි ටෙක්නොලොජි ආයතනය සමඟ සාකච්ඡා කර අළුත්වැඩියා කිරීම් සඳහා ගිවිසුමකට එළඹීම.

09.බිබිල ප්‍රාදේශීය සභාවේ රථවාහන සේවා මධ්‍යස්ථානයේ හයිඩ්‍රොලික් ජැක් (8TON) සවිකිරීමේදී අවශ්‍ය වන HD /68 ඔයිල් 400 L ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

10.බිබිල ප්‍රාදේශීය සභාව සතු ZA 5419 දරණ මෝටර් ග්‍රේඩරය සඳහා නව කැපුම් තල යුගලයක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම

11.බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරයේ ඉදිරිපස මාර්ගය සකස් කිරීම සඳහා වන වැඩකටයුතු සිදු කර ගැනීම සඳහා බැකෝ ලෝඩර් යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කර කුලියට ලබා ගැනීම.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

ඒ අනුව නිර්දේශ අංක 1-4 දක්වා නිර්දේශ හැර 5-11 දක්වා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.14.රදලියද්ද ආදාහනාගාරයේ ඉදිරිපස මාර්ගය ඉන්ටලොක් ගල් අල්ලා (සෘජු ශ්‍රම පදනම මත ක්‍රියාත්මක කිරීම ) සකස් කිරීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශිය සභාවට අයත් රදලියද්ද ආදාහනාගාරයේ ඉදිරිපස මාර්ගය ඉන්ටලොක් ගල් අල්ලා (සෘජු ශ්‍රම පදනම මත ක්‍රියාත්මක කිරීම) සකස් කිරීම සඳහා රු.724,116.64 ක මුදලක ඇස්තමේන්තුවට අනුව සිදු කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කර සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.15. 2025 පළාත් පාලන සතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වියදම් දැරීම සම්බන්ධවයි.**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/7/3/ප.පා.සතිය 2025 හා 2025.08.07 දිනැති ලිපිය මඟින් හා ඌව පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 12/4/2 ප.පා.සතිය 2025 හා 2025.08.13 දිනැති ලිපිවලට අනුව පළාත් පාලන සතිය - 2025 වැඩසටහන යටතේ 2025.09.15 දින සිට 2025.09.21 දින දක්වා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස දන්වා ඇත. ඒ අනුව එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වැයවන වියදම් පියවා ගැනීම සඳහා සභා අරමුදලින්දළ වශයෙන් රු.200,000.00ක මුදලක් වෙන් කර ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කර සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.02. ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා.**
**05.02.01. බිබිල දොඩම්ගොල්ල කොට්ඨාශයේ සංවර්ධන යෝජනා සම්බන්ධවයි.**

01.මැදපිටිය හැමගස්දෝව මාර්ගය මීටර් 100ක් කොන්ක්‍රීට් කිරීම.

02.ඊතණවත්ත පොදු සුසාන භූමියට යාබදව ඇති පැති බැම්ම සකස් කිරීම.

03.කනුල්වෙල මුස්ලිම් ජනතාවගේ සුසාන භූමිය පස් වැටියක් සකස් කර භූමදානය සඳහා බිම සකස් කිරීම.

04.දොඩම්ගොල්ල කකුරුගොල්ල අරාව පොදු සුසාන භූමිය හා මාර්ගය පිළිසකර කිරීම.

05.දෙහිඅත්තාවෙල අබලන් වී ගමන් කිරිමට අපහසු මාර්ගවල වලවල් පස් දමා පිලිසකර කිරිම හා අතුරු මාර්ග මෝටර්ග්‍රේඩර් කිරීම.

බිබිල දොඩම්ගොල්ල කොට්ඨාසයේ මෙම සංවර්ධන කටයුතු සිදු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම අවස්ථාවේදී මාර්ග ප්‍රතිසංස්කරණය , සභාව සතු වාහන සඳහා වැය වන ඉන්ධන සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.03.ගරු මන්ත්‍රී එල්.ඒ.බී. චින්තිකා හර්ෂණී මැතිතුමිය</u>

## <u>05.03.01. බිබිල කොට්ඨාසයේ සංවර්ධන යෝජනා</u>

01.බදුල්ල පාර පන්සල් වත්ත මාර්ගයේ කොන්ක්‍රීට් කර ඇති ස්ථානයේ සිට මෙම මාර්ගයේ යාබද වන අම්බලම හන්දිය දක්වා ඉතිරි කොටස ගල් අතුරා කොන්ක්‍රීට් කිරීම හෝ වෙනත් සුදුසු අන්දමකින් අබලන්ව පවතින මෙම මාර්ගය සංවර්ධනය කිරීම.

02.පන්සල් වත්තේ සිට අම්බලම හන්දිය දක්වා ඇති මාර්ගයේ සිට කවුඩැල්ල ගල්ලිද මාර්ගය ඉදිරිපිට බදුල්ලගම්මන ප්‍රධාන මාර්ගයට යාබද වන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම.

03.ගල්ලිද මාර්ගයේ කොන්ක්‍රීට් යොදා ඇති ස්ථානයේ සිට ඉතිරි කොටස කටුපොත කාපට් කර ඇති මාර්ගයට යාබද වන පරිදි සංවර්ධනය කිරීම.

04.කවුඩැල්ල බෝධිය අසලින් ආරම්භක කාපට් මාර්ගයේ සිට රතුපස්කැටිය ප්‍රධාන මාර්ගයට යාබද වන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම.

05.මහියංගන මාර්ගයේ කැම්බෝ හොටෙල් අසලින් ආරම්භ වන පොලිසිය අසල බලවේග මාර්ගයට යාබද අතුරු මාර්ගය සංවර්ධනය කිරීම.

06.දැව කැටිය වැලිපොත මාර්ගය සංවර්ධනය කිරීම.

07.දොඩම්ගොල්ල මාර්ගයේ සිට බලවේග මාර්ගය දක්වා ඉතිරි කොටස සංවර්ධනය කිරීම.

08.අඹගොල්ල හන්දිය අසලින් ආරම්භ වි බලවේග මාර්ගය බුදු පිළිමය අසලට යාබද මාර්ගය වැඩි දියුණු කිරීම.

09.දම්පතිගම මාර්ගයට යාබද වන බේකරිය මාර්ගය සංවර්ධනය කිරීම.

10.දම්පතිගම මාර්ගයේ සිට ආරාමය අසලින් ආරම්භ වී ළිඳකුඹුර සුසාන භූමිය අසලින් පිටකුඹුර ප්‍රධාන මාර්ගයට යාබද මාර්ගයේ ඉතිරි කොටස් සංවර්ධනය කිරීම.

11.ළිඳකුඹුර කකුරුගොල්ල අරාව හරහා නාගල පන්සල දක්වා පිහිටා ඇති මාර්ගයේ ඉතිරි කොටස් සංවර්ධනය කිරීම.

12.ළිඳකුඹුර කණුගොල්ලවත්ත දක්වා ඇති මාර්ගය කණුගොල්ලවත්ත මාර්ගය සංවර්ධනය කිරීම.

13.දම්පතිගම මාර්ගයේ සිට කිවුලපිටලන්ද සුසාන භූමි මාර්ගය සංවර්ධනය කිරීම.

14.බිබිල කැබැල්ලකැටිය කොටසේ අතුරු මාර්ග කිහිපයක තුංමන්හන්දිවලට විදී ලාම්පු සවි කිරීම.

බිබිල කොට්ඨාසයේ මෙම සංවර්ධන කටයුතු සිදු කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## <u>05.04.ගරු මන්ත්‍රී වසන්ති ප්‍රියදර්ශනි සමරකෝන් මැතිතුමිය</u>

## <u>05.04.01. බිබිල වැගම කොට්ඨාසයේ කඩිනමින් අවශ්‍ය මාර්ග සංවර්ධන සහ වෙනත් යෝජනා</u>

**වැගම උතුර**

01. පත්තිගේ වත්ත මාර්ගය කාණු දමා සැකසීම.

02. 2 කනුව සුසාන භූමිය (පොල් කොහු මෝල අසලින්) මාර්ගය අඹගොල්ල මාර්ගයට සම්බන්ධ වන ස්ථානය දක්වා කි.මී. 2 1/2 පමණ මට්ටම් කර කාණු දමා සැකසීම.

03. දෙහිගහලන්ද මාර්ගය මට්ටම් කර කානු යොදා සැකසීම.

**වැගම දකුණ**

01. තුඹලේරුව කහඹිලියාලන්ද වටවන මාර්ගය(කැලෑවැදී ඇති) කාණු දමා සැකසීම.

02. 3 කනුව පහලකුඹුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

03. දෙල්කැටිය මාර්ගයේ බුදුමැදුර අසලින් ඇති මාර්ගය දෙක කාණු දමා මට්ටම් කර සැකසීම.

**කරගහවෙල නැගෙනහිර**

01. හැමගස්මුල්ල පහල වැව මාර්ගය දිය පාරට බෝක්කුවක් දමා සැකසීම.

02.වැලිකඩ මාර්ගයෙහි ඉතා අබලන්ව ඇති 1Km ක් කොටස කානු දමා මට්ටම්කර පසුව කොන්ක්‍රීට් කිරිම.

03. මහවෙල ලන්ද ඇලපාර කාණුදමා මට්ටම්කර පිලිසකර කිරිම.

**කරගහවෙල බටහිර**

01. 5කණුව නිකේතනය අසලින් ඇති මාර්ගයේ සුසාන භූමිය අසල කොටස ඉතා අබලන් තත්වයේ ඇති බැවින් ගම ඇතුලට හදිසි තත්වයකදි වුවත් වාහනයක් ගමන් කිරිමට ඉතා අපහසු වී ඇති 75mක් පමණ කොටස කොන්ක්‍රීට් කිරිම.

02.කරගහවෙල සිට දෙහිගලවත්ත දක්වා ඇති මාර්ගය යෑමට අපහසු කොටස වන 3Km ක් පමණ බෝක්කු දමා පිලිසකර කිරිම.

03.හපුකොටෙලන්ද මාර්ගයේ ආනන්ද මහතාගේ නිවස අසලින් ඇති මාර්ගය කාණු දමා පිලිසකර කර පසුව කොන්ක්‍රීට් කිරිම.

04.කොබ්බෑගොල්ල බෝ ගස අසල(අනුර මහතාගේ නිවස අසල)මාර්ගය 1Km ක් යන්ත්‍ර යොදා මට්ටම් කර කොන්ක්‍රිට් කිරිම.

**කෙහෙල්ලත්තාවෙල**

01. දලුකහේන ගම්ප්‍රදේශයේ ජනතාව ඉතා උග්‍ර ජල (බීමට) ප්‍රශ්නයකට මුහුණ දී තිබෙන අතර ඔවුන්ට පානීය ජලය ලබා දීමට නල ළිඳක් සකසා දීම හෝ නල ජලය මඟින් බට යොදා ජලය ලබා දීමට සැකසීම.

02.පෙරියපැලැස්ස ප්‍රජා ශාලාව අසල තිබෙන ක්‍රීඩා පිටිය හා සුසාන භූමිය පිලිසකර කර දීම.

03.දලුකහේන මාර්ගය මට්ටම්කර කානුදමා පිලිසකර කිරිම.

**බිබිල - වෑගම කොට්ඨාශය සඳහා**

**අවශ්‍ය විදුලිලාම්පු සහ අක්‍රීය විදුලි ලාම්පු ගණන**

| අ/අ | ස්ථානය | නව විදුලි ලාම්පු ගණන | අක්‍රිය විදුලිලාම්පු ගණන |
|---|---|---|---|
| | **කරගහවෙල නැගෙනහිර/බටහිර** | | |
| 01 | 5 කනුව සිට කොටගම මාර්ගයේ වැලිකඩ හංදිය තෙක් | 05 | 03 |
| 02 | කරගහවෙල මාර්ගයේ හුණුවංගුව දක්වා | 03 | - |
| 03 | පේරගස් පිටිය මාර්ගයේ (නිකේතනය අසලින් ඇතුලට) සුසාන භූමිය අසල ඇති කණුවට | 01 | 02 |
| 04 | පිටමුල්ල හන්දිය | 02 | - |
| | **වෑගමඋතුර/දකුණ** | | |
| 01 | බොරගල්ගොඩ මාර්ගයේ | 02 | - |
| 02 | දෙල් කැටිය මාර්ගයේ බුදුමැදුර අසලින් දකුණට ඇති මාර්ගයට | 03 | 01 |
| 03 | දෙල් කැටිය මාර්ගයේ බුදුමැදුර අසලින් උතුරට ඇති මාර්ගයට | 03 | - |
| 04 | හේන් ගෙදර මාර්ගයට | 04 | - |
| 05 | 2 කනුව කොහුමෝල අසලින් ඇති සුසාන භූමි මාර්ගයට | 03 | |
| 06 | හින්නාපිටිය මාර්ගය සඳහා | 02 | - |

බිබිල වැගම කොට්ඨාසයේ මෙම සංවර්ධන කටයුතු සිදු කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.05.ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා

### 05.05.01. කොටගම කොට්ඨාසයේ බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා ඇස්බැස්ටෝ තහඩු ඉල්ලුම් කිරීම.

එගොඩ කොටගම වසමෙහි ඉදිකර ඇති බහු කාර්ය ගොඩනැගිල්ලෙහි අධික සුළං තත්වයක් නිසා වහලෙහි සෙවිලි කර තිබූ ඇස්බැස්ටෝ තහඩු විසිවී ගොස් ඇති බැවින් එම ගොඩනැගිල්ල සඳහා අඩි 08හි ඇස්බැස්ටෝ තහඩු ලබාදී වහලය පිළිසකර කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

එගොඩ කොටගම වසමෙහි ඉදිකර ඇති බහු කාර්ය ගොඩනැගිල්ල බිබිල ප්‍රාදේශීය ලේකම්තුමා සතු ගොඩනැගිල්ලක් බැවින් එම ගොඩනැගිල්ල සඳහා ප්‍රතිපාදන සැපයීමට බිබිල ප්‍රාදේශීය සභාවට නොහැකි බැවින් , අධික සුළං තත්වයක් නිසා මෙම ගොඩනැගිල්ලෙහි වහලය සෙවිලි කර තිබූ ඇස්බැස්ටෝ සීට් විසිවී ගොස් නිරාවරණය වී ඇති බැවින් ඒ සඳහා අඩි 8ක් දිග ඇස්බැස්ටෝ සීට් 08ක් සෙවිලි කර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බිබිල ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යොමු කිරීමට ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### 05.05.02.යල්කුඹුර මො/සිරිධම්මපාල විද්‍යාලයේ පානීය ජල හිඟය උදෙසා ජල නල පද්ධතියක් ලබාගැනීම සම්බන්ධවයි.

මෙම පාසලේ ඉගෙනුම ලබන දරුවන් හට දරුණු පානීය ජල හිඟතාවයක් පවතින බැවින් එම තත්වය මගහරවා ගැනීම සඳහා ජලනල පද්ධතියක් ලබා ගැනීමට ඇස්තමේන්තුගත මුදල රු.35000.00ක් පමණ වන බවත් ඒ සඳහා මූල්‍යමය ආධාර හෝ එම ජලනල පද්ධතිය සකස් කර දෙන ලෙස එම පාසලේ විදුහල්පතිතුමා ඇතුළු පාසල් සංවර්ධන සමිතිය විසින් බිබිල ප්‍රාදේශීය සභාව මගින් සිදු කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. එබැවින් දරුවන්ගේ පිපාසය සංසිඳවීම සඳහා එම ජලනල පද්ධතිය සකස් කර දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මො/සිරිධම්මපාල විද්‍යාලය පිහිටා ඇත්තේ යල්කුඹුර ප්‍රදේශයේය. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ජල මූලාශ්‍රය පිහිටා ඇත්තේද මෙම ප්‍රදේශයේ බවත් මෙම ජල මූලාශ්‍රය මගින් මුදලක් අය නොකර වෙනත් බල ප්‍රදේශයක් වන මැදගම බල ප්‍රදේශය සඳහාද ජලය ලබා දෙනු ලබයි. මෙම ජල මූලාශ්‍රය පිහිටා ඇති ප්‍රදේශයේ දරුවන් ජල පිපාසාවෙන් පෙළීම කණගාටුවට කරුණක් බවත් එබැවින් මෙම පාසල සඳහා පානීය ජලය ලබාදීමට කටයුතු කිරීමට ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පැවරීමට සලස්වන ලෙස දන්වා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට ඉදිරිපත් කිරීමටත් දැනට මෙම පාසල සඳහා පාසල අසල නිවසකින් ජලය ලබා දෙන අතර එම නිවැසියන් විසින් ජලය ගබඩා කිරීම සඳහා වාචිකව ඉල්ලුම් කර ඇති බැවින් ඒ සඳහා සභාවේ ඇති ජල ටැංකියක් තාවකාලිකව ලබාදීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.06.ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය.</u>
## <u>05.06.01. පතිගවත්ත මාර්ගයේ අත්‍යාවශ්‍ය බෝක්කු ඉදි කිරීම සඳහා</u>

වැගම කොට්ඨාසයේ වැගම උතුර ග්‍රාම සේවා වසමේ පතිගවත්ත ගල්කඩවෙල මාර්ගයේ ඒ දණ්ඩක් දමා වසර ගණනාවක් තිස්සේ ගම්වාසීන් භාවිතා කරනු ලබන තාවකාලික බෝක්කුව හියුම් පයිප්පයක් යොදා සැකසීමට හා එම මාර්ගයේ කුඩා දිය පාරවල් දෙකක් සඳහා හියුම් පයිප්ප දෙකක් යෝදා බෝක්කු සකස් කර දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.06.02.පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභා කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

2025.08.12 දින පැවැති පරිසර හා පහසුකම් පිළිබඳ කමිටුවේදී ගන්නා ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

- බිබිල නගරයේ බස් නැවතුම්පලේ ඇති යකඩ කූඩ සඳහා බදුන්, හා නගරයේ තැනින් තැන දිරන කසල හා නොදිරන කසල බැහැර කිරීම සඳහා බදුන් 25 ක් පමණ මිලදී ගැනීම.
- පෞද්ගලික බස් රථ හිමියන්ගේ සංගමයට හා ලංකා ගමනා ගමන මණ්ඩලයට දිනපතා ධාවනය වන බස් රථ ගමන් කරන වේලාව ප්‍රචාරය කිරීමට හා එම ප්‍රචාරක කටයුතු අතර තුර කසල නිසි ලෙස බැහැර කිරීම පිළිබඳ දැන්වීම් ප්‍රචාරය කිරීමට.
- නගරයේ ඇති කඩ සාප්පු වලින් බැහැර කරන දිරන හා නොදිරන කසල බැහැර කිරීම සම්බන්ධව වෙළඳ ප්‍රජාව දැනුවත් කරන අත් පත්‍රිකාවක් සකස් කිරීම.
- නගරයේ කාණු පද්ධතිය සකස් කිරීම සඳහා කූඩා ස්කෙයා වේටයක් කුලියට ගැනීම.
- බස් නැවතුම්පල උඩු මහලේ පොළිස් මුර පොළක් ස්ථාපනය කිරීම.
- නගරයට අත්‍යවශ්‍ය ව ඇති දැන්වීම් පුවරුවක් සකස් කිරීම.
- සති පොළ භූමියේ ඇති වැසිකිළි පද්ධතිය භාවිතා කරන වෙළඳ ප්‍රජාවට ඔවුන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා Token (ටෝකන්) සකස් කිරීම.
- බිබිල නඟයේ සිට බදුල්ල මාර්ගයේ ස්ටැයිලෝ ආයතනය අසල,වසා දමා ඇති කඩ කාමර දෙක පිළිබඳව තිරණයක් ගැනීම.
- නගරයේ දෛනිකව වෙළඳාම් කරන වෙළඳුන් තම දෛනික වෙළඳාමේන් බැහැර කරන කසල නිසි පරිදි බැහැර කිරීම හා මහජනතාවට පීඩා කාරී අන්දමින් නොහැසිරෙන ලෙස දැනුවත් කිරීම.
- නගරයේ ඇති මස් අලෙවි සැල් පිළිබඳ තීරණයක් ගැනිම.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.

- 2025 ජුලි මස 30 වන දින පැවැත් වූ මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව

- 2025.08.12 වන දින පැවති පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

මෙම ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරමි.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලිම.

2025 ජුලි මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07) සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු.15,629,560.11 |
| මූලධන ලැබීම් | - රු. - |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. - |
| වෙනත් ලැබිම් | - රු. 583,716.12 |
| මුළු ලැබීම් | - රු.16,213,276.23 |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 8,556,713.24 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 384,097.18 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු. 6,883,453.34 |
| ආයෝජන | _රු. - |
| මුළු වියදම් | - රු 15,824,263.76 |

**2025.06.31 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 9,781,057.09 |
| අක්කර බදු | - රු. 934.10 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 355,745.00 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 80,840.00 |
| කුලී මුදල් | - රු. 1,227,716.67 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 2,685,512.80 |
| එකතුව | - රු 14,131,805.66 |

## 08.වෙනත් කරුණු

## 08.01. 2025 වර්ෂයේ පළමු හා දෙවන කාර්තුවට අදාළ අභ්‍යන්තර විගණන වාර්තාව (ආදායම් ප්‍රගතිය)

බිබිල ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ පළමු හා දෙවන කාර්තුවට අදාළ බිල්කල ආදායම එකතු කිරීමේ ප්‍රගති වාර්තාව හා 2025.01.01 දිනට පැවති හිඟ ශේෂයෙන් අයවීම ප්‍රගති වාර්තාව මෙම ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරමි.

## 08.02.ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමාගේ නිවාඩු දැනුම්දීම.

ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇති අතර නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසී ය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය අදහස් දැක්වීම.

පළාත් පාලන ආයතන සඳහා 2025 වර්ෂයේ මන්ත්‍රී මණ්ඩලය තේරී පත්වූ පසු, මාසික ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම් දෙකක් පවත්වා ඇති බවත් ඒ සඳහා සහභාගී වීමට මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කර නොමැති බැවින් මින් ඉදිරියට පැවැත්වෙන ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම් සඳහා සහභාගී වීමට මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කරන ලෙසත්, එක් එක් කොට්ඨාස තුළ සංවර්ධන කටයුතු සිදු කිරීමේදී පක්ෂයේ මන්ත්‍රීන්ට මෙන්ම විපක්ෂ මන්ත්‍රීවරුන්ටද දන්වන ලෙසත් තමන්ද ඒ සඳහා සහයෝගය ලබා දීමට කැමති බවත් පැවසීය.

### ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා අදහස් දැක්වීම.

තමන් විසින් ඉදිරිපත් කර ඇති යෝජනා සභාවට ඉදිරිපත් කර නොමැති බවත් තමන්ගේ යෝජනා වල ඇතුළත් මාර්ග විශාල ප්‍රමාණයක් මේ වනවිට මෝටර් ග්‍රේඩර් කර අවසන් වුවත් තවත් මාර්ග කිහිපයක් ප්‍රතිසංස්කරණය කිරීමට ඇති බැවින් එම මාර්ග කැපීම සඳහා මෝටර් ග්‍රේඩරය ලබා දෙන ලෙස ද ඉල්ලීමක් කර සිටියේය.

### ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා අදහස් දැක්වීම.

ප්‍රාදේශීය සභාවේ මාසික මහ සභාව සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේදී මීට පෙර මාස දෙකක පැවති මහ සභාවලට ආදායම් උත්පාදන මාර්ග සඳහා යෝජනා ඉදිරිපත් වී නොමැති බවත් ඉදිරි සභා වාරයන් සඳහා ආදායම් උත්පාදන යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බවත් සැප්තැම්බර් මස සිට 2026 අප්‍රේල් මස දක්වා කාලය වර්ෂා කාලය බැවින් එම නිසා ඊට පෙර මාර්ග මොටර් ග්‍රේඩර් කර අවසන් කිරීම සුදුසු බවයි.

තම කොට්ඨාසය වන නිල්ගල කොට්ඨාසයේ මකරට යන මාර්ගය වන දමුණුවින්න මාර්ගයේ බෝක්කුව ඉදිකර අවසන් බවත් ඊට මඳක් ඉදිරියෙන් වැසි කාලයට ගමන් කළ නොහැකි 300m ක පමණ කොටසක් පවතින බැවින් එය මොටර් ග්‍රේඩර් කර ප්‍රතිසංස්කරණය කිරීමට සුදුසු බව පැවසීය. මෙම මාර්ගය ඉදිකලහොත් මකර බැලීමට යන සංචාරකයින්ට පිටුවහලක් වන බවත්, වරිපනම් සීමා

වැඩි කිරීම, දැන්වීම් පොස්ටර් ප්‍රදර්ශනය කිරීම වැනි ක්‍රම තුළින් ආදායම් උත්පාදන මාර්ග සකස් කර ගැනීම මඟින් සභාවේ ආදායම වැඩිකර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවද පවසාලීය.

ගරු මූලාසනය විසින් 2025 අගෝස්තු මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කර 2025 සැප්තැම්බර් මසට අදාළ මහ සභා රැස්වීම සැප්තැම්බර් 23 දින පෙ.ව.9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව අගෝස්තු මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -
01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි